බළන්ගොඩ නගර සභාව.

2011 වර්ෂය සඳහා බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 17 මස් කඩය බදු දීම සඳහා

# ලංසු ආරාධනයයි.

2011 ජනවාරි මස 01 වන දින සිට 2011 දෙසැම්බර් මස 31 දින දක්වා කාලයට පොදු වෙළඳසැල මස් කඩ බදු දීම සඳහා මුද්‍රා තබන ලද ලංසුපත් බළන්ගොඩ නගර සභාවේ සභාපති වන මා විසින් වර්ෂ 2010 දෙසැම්බර් මස 15 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් විවෘත කිරීම 2010 දෙසැම්බර් මස 15 වන දින පෙ.ව.10.30 ට මෙම කාර්යාලයේ දී සිදුකරන අතර , මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

03. 2010 දෙසැම්බර් මස 14 වන දින ප.ව.03.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන අතර , වැඩි විස්තර නගර සභා කාර්යාලයෙන් ලබාගත හැකි වේ. කාර්යාලයේ දුරකථන අංකය : 045-2287275 වේ. බදුදීමට නියමිත පොදු වෙළඳසැල මස්කඩ පිළිබඳ විස්තර පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත.

**සැළකිය යුතුයි** :-

- කුකුළු මස් කඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් 2010.12.31 දිනට නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රමිතියට තැනූ බලපත්‍ර සහිත අනුමත ඝාතකාගාරයක් සපයාගත හැකි බවට ලේඛන ඉදිරිපත් කළ යුතුය.
- නගර සභාව විසින් ඝාතකාගාරයක් සපයා දෙනු ලැබුවහොත් , එකී ඝාතකාගාරය යොදා ගැනීමට ටෙන්ඩර්කරු එකඟවිය යුතුය.

## උපලේඛනය

| වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු (වැට් හා ජා.ගො.බ. සහිතව) | අවම වාර්ෂික ලංසුව |
|---|---|---|---|
| 01. පොදු වෙළඳසැල අංකː 17 (කුකුළු මස් කඩය) | රු. 5,000.00 | රු. 577.00 | රු. 250,500.00 |

- අවම ලංසුවට අමතරව රජය විසින් කලින් කලට අනුමත කරනු ලබන බදු මුදල් ද ගෙවිය යුතුය.
- තෝරාගන්නා ලද බදු කරුවන් එක් මසක සම්පූර්ණ කුලිය පැයක් ඇතුළත සභාවේ තැන්පත්කළ යුතුය.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2010.11.26 වන දින
බළන්ගොඩ නගර සභාවේ දී ය.